''මම ලහිරු යුනිවසිටියේ දී දැකල තියෙනව''

'' ඔව් අපි උඹලට වඩා කලු හින්ද වැඩියෙන් පේනව ඇති'' මා ඒ වචන පිට කලේ නැත. ඒ වෙනුවට

''ඇත්තට ම, මට නම් මතකයක් නැහැ'' යැයි කීවෙමි.

''කැන්ටිමේ දී.... මම දැකල තියෙන්නෙ..... ඔයාගෙ යාලුවොත් එක්ක. ඔයාගෙ රටේ අය ම වෙන්න ඇති එයාලත්''
''ඔව්...... ඒ මගේ රටේ අය... මගේ යාළුවෝ..... ඉතින් උඹට මොකද..... උඹලත් එක්ක යාළුකම් පවත්වල අපේ රටට වෙලා තියෙන හරිය මදෑ.....''
හිත ඇතුලින් මම ඇයට බැණ වැදුනෙමි. එහෙත් ඇයට කුමන හෝ පිළිතුරක් ලබාගැනීමට ඇති ඉඩකඩ අහුරා කල් ඇතුව ම බසය පැමිණුනේ ය. ඈ ඉඳගත් අසුන පසුකරගොස් මම ඊට පිටුපස අසුනක වාඩිවීමි.

බසය පයින් ගස් පෝලිම පසුකරයි. ඊළඟට මුණගැසෙන නැවතුම් දෙකෙන් එකක මා බැස ගත යුතු ය. ටානාා බහින්නට සුදානමක් නැත. අනිකුත් සිසුන් සමඟ මම මුල් නැවතුමෙන් බැස ගතිමි. මේ කෙල්ල මා පසුපසින් පැමිණෙනවා හෝ නොපැමිණෙනවා වන්නට පුළුවන. නමුත් මා ආපසු හැරී බැලුවේ නැත.

ටානාා කෙරෙහි සැලකිල්ලක් නොදක්වන්නට මට තවත් කරුණු තිබිණි. ඈ කෙරෙහි කිසිම සිත් ඇදගන්නා සුළු ගතියක් මම නොදුටිමි. ඈ සිටියේ උරහිස් දක්වා කඩා හැලුනු කොණ්ඩය විදහාගෙන ය. ලස්සනට මුහුණට ගැලපෙන ආකාරයකට ඒ කොණ්ඩය ඈ කැපුවානම් ඊට වඩා ලස්සනට ඈ පෙනෙන්නට තිබිණි. බාච්චුවක් වැනි දිගට දිගේ ඈ හැඳ සිටි සාය ලංකාවේ දී වෙළෙඳාමේ යෙදෙන ගැහැණියක්වත් ඇඳ සිටිනවා මම දැක නොතිබුනෙමි. තොල් ආලේප ටිකක්, නිය සායමක් - මේ කිසිවක් ඈ වෙත තිබෙනවා ඊට පසු කාලයක ද මා දුටුවේ නැත. ඈ මට මුණ ගැසුනු සෑම අවස්ථාවකට ම මොහොතකට පසු මා කලේ මිතුරන් සමඟ ඈට සිනාසීම ය.

'' මචං කෙල්ල හැබැයි උඹට කැමතියි.... මේ ඉන්න ටිකේ ඔන්න ඔය බඩුව දාගනින්....''
''උඹට පිස්සුද මහේල?''

''නෑ බං මම කිව්වෙ කසාද බඳින්න නෙමෙයි...... ඔහේ සොමියටත් එක්ක ඉන්න ටිකක් දාගනින්''

''චී.... මහේල උඹ හිතන්න එපා මම බලු වර්ගයේ එකෙක් කියල''

''ඔච්චර උඩ යන්න දෙයක් මම කිව්වෙ නැහැ. උඹට එපානම් නිකම් ඉඳපන්.....''
ටානාා කෙරෙහි මා කොතරම් නොසැලකිලිමත් වුව ද එවැනි හැඟීමක් කිසි දිනෙක මම ඇති කරගෙන නොසිටියෙමි. රැවටීමේ අරමුණින් කෙල්ලන් ඇසුරු කිරීම කොයි තරම් පහත් සිතිවිල්ලක් ද...? ලංකාවේදී මගේ යහළුවෙක් එවනි අදහසක් මගේ ඔළුවට දැම්මා නම් මෙසේ කතාව ලෙහෙසියෙන් අවසන් කරන්නට මා ඉඩ දෙන්නේ නැත. නමුත් මහේල මම අතර මගදී අහුලාගත් යහළුවෙකි. මහේලගේ අදහස් වෙනස් කරන්නට හෝ ඒ වෙතට බලපෑම් කරන්නට අයිතියක් මට නොමැත. කෙසේ වුව ද ඉන්පසුව ටානාා හාසායට ලක්කරලීම මම සම්පූර්ණයෙන් ම අත්හැර දැමුවෙමි. විශේෂයෙන්ම මහේලටත් ඒ සඳහා අවස්ථාවක් සලසා නොදී ම ගැන ද සැලකිලිමත් වීමි.
මගේ වැලමිට රිදුම් දෙන තරම් වේලාවක් මම තාප්ප බැම්මට හේත්තුවී සිටි බවක් මට තේරුම් ගියේ සිතුවිල්ලෙන් මිදුනු මොහොතේ ය. ගැඹුරු සුසුමක් මා හෙලුවේ නොදැනුවත්වම ය. නවාතැනට පිටත්වීමට සිතා මම ආපසු හැරුනෙමි. ඒ මොහොතේ ම නැවත ආපස්සට හැරී තාප්ප බැම්මට මුහුණ ඔබාගැනීමට සිත් වූවද මා ප්‍රමාද වූවා වැඩිය. මිතුරියන් රොත්තක් පිරිවරාගෙන ජානකී මා දෙසට එමින් සිටියා පමණක් නොව ඒ වන විට මා හඳුනාගෙනද සිටියා ය.

''ලහිරු අයිය ආවයි කියල අම්ම කව්ව. හෙට එනව නේද අපේ ගෙදර''
''හෙට....?''
''මොකද පුදුම වෙලා.... එහෙනම් අම්ම කිව්වේ ප්‍රොමිස් උනා කියල...''

''මම.....?''

''මොකක් ද පුදුමෙ....? තාත්තට එදා අයිය ඉන්න තැන ඇඩ්‍රස් එක හරි ෆෝන් නම්බර් එක හරි ඉල්ලගන්න බැරි උනා කියල හරි අප්සට්. මට දෙන්න අද.... මම දෙන්නම් තාත්තට''

''මේ... මට හරියටම ෆෝන් නම්බර් එක මතක නැහැ ජානකී.... මම එනකොට අරන් එන්නම් හෙට''
මා පටලැවී ඇත්තේ ගැලවිය නොහැකි උගුලකය.

''ජානකී....යමු..''
ඇගේ සුදු මිතුරියන් සිටියේ නොඉවසිල්ලෙනි. අද සිකුරාදා සාප්පු යන්නට ඇත. සාප්පු ගියා ද... ආවා ද මට හරිහැටි පැහැදිලි නැත. තවම ඒ තරම් හවස්වී නැත.

''ඕකේ ජානකී... සී.. යූ...''
මා එතනින් ඉක්මනින් ඉවත්වූයේ හදිසි ගමනක් යන්නට ඇත්තා මෙන් ය. මා පඩිපෙල දිගේ බැස දුම්රිය වේදිකාවට ගොඩඋනේ අරමුණකින් තොරව ය. මම එහි දිගට ම ඇවිද ගියෙමි. විශේෂයෙන්ම ජානිකීට පේන්නට මග නැවතීමට ඇති අකමැත්ත නිසා ම ආරූඪකරගත් හදිසසියකින් මම ඇවිද ගියෙමි.

මේ වන විට පර්ත් සිට මඅඩොක් යුනිවර්සිටිය දක්වා සීඝ්‍රගාමී බස් සේවාවක් අරඹා ඇත. එය පිටත්වන්නේ විලින්ටන් ස්ට්‍රීට් ප්‍රධාන බස් නැවතුම්පලෙන් ය. දුම්රිය වේදිකාව කෙලවර තිබූ බස් නැවතුම්පලෙන් 185 බසයකට ගොඩවෙමි යැයි ම තුළට අදහසක් මේ වන විට ඇතුළුවී තිබිණි. මම බසයකට ගොඩවී ජනේලය අසල අසුනක හිඳගතිමි.
පාලම මත දී උස්බිමට ආසන්නව දකින ''කින්ස් පාක්'' උද්‍යානය, කුවිනානා අධිවේගී මාර්ගයත් සමග සමාන්තරව දිවෙන ස්වෝන් ගඟ, මේ සියල්ල තව තවත් මා සිතට මෑත යුගයේ මා පසුකර දැමූ දින ගණනාවක සමරු සටහන් රැගෙන ඒ.
ගිය දෙසැම්බරයේ මා ගෙදර යන විටත් ඒ සියලු ප්‍රිය සාද තාත්තා සංවිධානය කර තිබුණේ මතු බලාපොරොත්තු බොහොමයක් සිතේ රඳවාගෙන විය හැකි ය. මුල් ම දින අපි ගතකළේ තිඹිරිගස්යායේ පිහිටි ආච්චිලාගේ ගෙදර ය. ඒ මට මගේ ගෙදරටත් වඩා සුපුරුදු තැනකි. මගේ මුළු පාසැල් යුගය ම මා ගත කළේ ඒ ගෙදරය. මගේ සුපුරුදු කාමරයට වැද දවස් ගණනාවක් එහි ගතකරමියි මම මුලින් ම සිතුවෙමි. නමුත් පුළුවන් ඉක්මනින් ගෙදර යා යුතුයැයි මම සිතුවේ ඒ සියලු ප්‍රිය සාද මා සිතට වදයක් වූ බැවිනි.

''මොකද පුතා..... ඔයා යත්දිට වඩා හරි වෙනස්'' අම්මාට කිසිවක් වසන් කළ නොහැක.

''වෙනසක් නෑ අම්මා''
''වෙනසක් නැත්නම් ඔහොම ඉන්නෙ මොකද?''

''මට ඕනෙ ටිකක් නිදහසේ ඉන්න''

''ඉතින් පුතා නිදහසේ නේන්නම් ඉන්නෙ''
''මම කිව්වෙ මේ පාටීස් ගැන අම්ම''

''මට තේරුම් ගන්න අමාරුයි ඔයා කියන දේ ඕවට ඔයා ආස නිසා තමයි තාත්ත ඔයා එන්නත් කලින් ඉඳල ඕව ලැහැස්ති කලේ''

''මන් දන්නෙ නැහැ අම්ම..... අපි ගෙදර යන්නැද් ද දැම්ම?''
''ඔයාට ගෙදර යන්නද ඕනෙ.... අපි හෙටම යමු... එහෙ ගියහම ඔයාට පාලුවට තියෙයි කියල හිතලයි ටික දවසක් ඉන්න තීරණය කළේ....''

ඒ සීතල කඳුකරයේ තේ වත්තක් මැද මා අත් විඳින කාන් කවුරුවත් නැති හුදකලාව වෙන කවරදාකවත් නැති ලෙස මම ඒ දිනවල ප්‍රිය කළෙමි. යා යුතු දිශාවක් නොදන මා දැන් අතරමං වී ඇත යැයි මට හැඟී යන තරමේ දුරක් මම තේ වත්ත මැද දිනපතා ගමන් කළෙමි... විසිත්ත කාමරයේ පිහිටි වීදුරු ජනේල පේලිය අසල හාන්සිපුටුවේ දිග ඇදී, ඇත කඳු බෑවුමේ මීදුමින් බොඳව පවතින දර්ශන පථය මදින් මද හිරු රැස් වැටීමෙන් පැහැදිළි වන අයුරු වරු ගණන් බලාසිටීම මම පුරුද්දක් කර ගතිමි. අම්මා විසින් පින්තාරු කර මුල්ලක ගොඩ ගසා තිබෙන දර්ශන සමූහය එකින් එකට දිගහැර, ඒවා තුළ අලුත් යමක් සෙවීමට මම උත්සාහ ගතිමි. ගෙදර එන දවසක් ඇත්නම් මේක අල්ලා විසි කළ යුතු යැයි අම්මා සමඟ වාද අල්ලන, විසිත්ත කාමරයේ කොණක අම්මා විසින් ලස්සනට තබා ඇති දිරා ගිය අරලියා ගසේ වෙන කවරදාවකවත් නොදුටු චමත්කාරයක් ඒ වන විට මම දකිමින් සිටියෙමි.....

''ලහිරු.... දැන් ඔයා රෙස්ට් කලා ඇති..... මොනවද දැන් පුතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ.....''

ළබන කළාපයට

පත්තර
මිත්තරයාගේ

අල්ලස් කොමිසම මහින්ද විජේසේකරගෙන් පැය තුනක් ප්‍රශ්ණ කරයි.
ලංකාදීප
ප්‍රශ්ණයක් නැහැ මන්ත්‍රී තුමා.. ඒතනින් එහාට මොකුත් වෙන්නෙ නැහැ..

’’

ජනපතිනිය සමග ක්ලින්ටන් සාකච්ඡාවේ
ලංකාදීප
පරිස්සමෙන් නෝනේ... ඔය හාදයා එක්ක වැඩි බජනේ හොඳ නෑ...

’’

විදුලි බල නියෝජ්‍ය ඇමතිට තනතුර එපා වෙයි.
ලක්බිම
එපා වෙනවා විතරයි.. දාලා යන්නෙ නෑ...

’’

ජාතික හෙළ උරුමය ජනපතිවරණයට තරග කරනවා - එල්ලාවල මේධානන්ද හිමි
ලක්බිම
සාදු .. සාදු ... සාදු....

’’

රනිල්ට යැවූ ඇරයුම නොපිළිගත්තාට ජනපතිනියගේ කණගාටුව
ලංකාදීප
උන්නැහේ බවලත් උදවියගේ ආරාධනා පිළිගන්න පස්ස ගහන බව ඔබ තුමී දන්නෙම නැද්ද හැබෑට...?

’’

හිටපු අගමැතිට අල්ලස් චෝදනා
ලක්බිම
නෑ.. නෑ.. ලංකාවෙ නෙවෙයි.. නේපාලයේ...

’’

වසරේ මුල් මාස තුන තුළ පමණක් අපරාධ 14833 ක්
ලංකා නිව්ස්පේපර්ස්.කොම්
කොහොමද අපේ වැඩ කිඩ...?

’’

රජයේ මුදල් වංචා කළැයි ඉන්දීය ඇමති වරයාට නඩු.
ලක්බිම
ඉන්දියාවට පිස්සුද මන්දා.. අපි නම් නඩු දාන්නේ හිටපු ඇමති වරුන්ට විතරයි..

’’

අපේ රග්බි පාලකයන්ට සැළසුමක් තිබුනේ නැහැ
ලංකාදීප
අප් කොයි පාලකයන්ටද සැළසුමක් තිබුණේ..?

’’

ඩෝහා හිදී කසිප්පු පෙරා විකිණූ ශ්‍රී ලාංකිකයන් පිරිසක් අල්ලයි
The Peninsula පුවතක්
අන්න නියම මිනිස්සු.... ගිය තැන රටේ නම්බුව තියනවා....